සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 02 යි<br>02 மணி நேரம்<br>02 Hour |
| සිංහල භාෂාව හා සාහිත්‍යය - III<br>சிங்கள மொழி மற்றும் இலக்கியம்<br>Sinhala language and literature | 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 |

උපදෙස්:-

- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න
- 1,2,3,4 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර 5,6,7 ප්‍රශ්න වලින් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න

**(01) අංක I සිට X තෙක් ඇති සියලුම අනු කොටස්වලට පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

I) අ) ජාතක පොත ලිවීමට මූලාශ්‍රය කරගත් ග්‍රන්ථය කුමක් ද? ආ) සිංහල ජාතක කතාවක ආකෘතික ලක්ෂණ 01 ක් ලියන්න.

II) අ) ජාතක පොත සිංහලයට පරිවර්තනය වීමට පෙර සිංහලයට නැංවී තිබූ ජාතක කතා 2 ක් ලියන්න

ආ) උම්මග්ග ජාතකයට එම නම යෙදීමට හේතුව කුමක් ද?

III) අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

ආ) "නැඟී සිටුව⁹ ආචාරීනි මා නොවඳුව" මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?

IV) අ) ගුත්තිල කාව්‍යයේ කතුවරයා කවු ද?

ආ) ගුත්තිල කාව්‍යය රචනා කිරීමට ආරාධනා කළේ කවු ද?

V) පන්සිළු වීණා නද පසු බැස්සූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
.................................................................
.................................................................

අ) ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ආ) ඉරි ඇඳි පදවල අර්ථය වෙන වෙනම ලියන්න.

VI) ..................................................................
..................................................................

කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් අරිනු

අ) ඉහත කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.

ආ) මෙම කවියෙන් කවියා අපට දෙන උපදේශය කුමක් ද?

VII) අ) බැද්දේගම ග්‍රන්ථයට පාදක වූ මුල් කෘතියේ නම කුමක් ද?

ආ) ලංකාවේ සේවය කරන කාලයේ දී එම කතුවරයා දැරූ තනතුර ලියන්න.

VIII) "මේ ගම කිසි කලක කිසි කෙනෙකුට වගතුවක් නොවන සාප ලත් ගමක්"

අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලදද? ආ) ඉන් අනතුරුව සිදු වූයේ කුමක් ද?

IX) අ) ගුත්තිල කාව්‍යයේ කතුවරයාගේ ගුරුවරයා කවුද?
ආ) ගුත්තිල කාව්‍ය රචිත කාව්‍යය යුගය නම් කරන්න.

අ) මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියේ කතුවරයා කවුද? ආ) එස්. මහින්ද හිමිගේ පැවිදි වූ සොහොයුරා කවුද?

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා පිළිතුරු ලියන්න.

I) ඒ <u>අභිමතාර්ථ</u> සාධක වූ <u>චින්තා මාණික්‍යයක්</u> බඳු වූ මාගේ ස්වාමි දරු වූ බෝධිසත්වයන් වහන්සේ එ මල් දඬු මුලින් උදුරුවා මේ බ්‍රහ්මදත්ත රජුට දෙවයි තමන් වහන්සේගේ පුරුෂයන්ට දුන්හ.

අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න. ආ) මෙහි දැක්වෙන උපමාවක් ලියන්න.

II) සතොස් කරන වීණ නද ඇසුමට
නොගොස් සිටින <u>පිල්බර ගණ</u> ගොඳුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සදැස් සවන් නොකළැයි වූ නොසතුට

අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථය වෙන වෙනම ලියන්න.

ආ) මෙහි සඳහන් පිල්බර ගණ නොසතුටට පත්ව සිටින්නේ ඇයි?

III) නිරිත දිග සුළඟට ඇඹර වී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය නැවී ඇඹරී තිබිණ. මුහුණේ සිහින්ව ගිය අත් පා වලත් සම ගසක පොත්ත තැනින් තැන ඉරිතැලී සුදුව යන්නාක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය.

අ) මෙම ඡේදයේ සඳහන් උපමාවක් හා උපමේයක් ලියන්න.
ආ) මෙහි විස්තර වන තැනැත්තිය කාගේ කවුද?

IV) <u>නහින දෙහින</u> කාලෙට පින් කෙරුම යුත
වහින කලට <u>කුරින්</u> විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත ් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

ආ) ඉරි ඇඳි පදවල අර්ථය වෙනවෙනම ලියන්න.

ආ) මෙම කවියෙන් දෙන උපදේශයක් ලියන්න.

IV) දිමුතු යසස් වන් කුසුම <u>සරාගේ</u>
නුමුතු සුවඳ මල් පැළඳ <u>සරාගේ</u>
දකිතු රඟන සුරඟන රඟලා ගේ
උමතු නොවෙද කෙලෙසක සිත කාගේ

අ) ඉරි ඇඳි පදවල අර්ථය වෙනවෙනම ලියන්න.

ආ) මුළු කවියේම අර්ථය ලිහිල ් බසින් ලියන්න.

- 3, 4 ප්‍රශ්න සඳහා වන පිළිතුරෙහි වචන 125 ක් පමණ තිබීම සෑහේ.

(03) මහෞෂධ පඬිතුමාගේ චරිතයේත්, කේවට්ට බමුණාගේ චරිතයේත්, ඇති සම විෂමතා උදාහරණ සහිතව දක්වන්න.

නැතහොත්

ගුත්තිල ජාතක කතාව කාව්‍යයට නැඟීමේ දී සරල බස් වහරක් ද, කාව්‍යමය වියත් වහරද, මනාව ගළපා ගන්නට කවියා සමත් වී ඇති බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(04) ජන කවියා තම අත්දැකීම් ඇසුරෙන් රසවත් ලෙසින් කාව්‍යාලංකාර යොදා ගැනීමට සමතෙකි. ඒ අනුව
අර්ථ රසය

ශබ්ද රසය

ඉස්මතුකර දැක්වීමට දැක් වූ කුසලතාවය "හානා හීය පානා අඬහැරෙන් දැනේ" කවි පෙළ ඇසුරෙන් විමසන්න.

නැතහොත්

බැද්දේගම හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කිරීම සඳහා
අවස්ථා නිරූපණය

චිත්ත රූප මැවීමට සමත් භාෂාව යොදා ගත් ආකාරය උදාහරණ දෙක බැගින් යොදා විමසන්න.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරාගෙන පිළිතුරු ලියන්න.**
  **පිළිතුරෙහි වචන 100 ක් පමණ තිබීම ප්‍රමාණවත් වේ**

(05) මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වෛදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න.

(06) වීණා වාදනයේ මිහිරියාව අසා තමාට තමා අමතක වූ ආකාරය විවරණය කිරීමට වෑත්තෑවේ හිමියන්' යොදාගත් අපූරු කාව්‍යය සංකල්පනා විවරණය කරන්න.

(07) ජන කවියා යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා උපදෙස් රාශියක් ලබා දී ඇත. උදාහරණ කවි 03 ක් යොදා ගනිමින් විස්තර කරන්න.